# ප්‍රයිම් ග්‍රාමීන් මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

3 කාණ්ඩය - නවවන කලාපය - 2015 මැයි



නිරූපනය : සමන්තා කුමාරි මහත්මිය

ප්‍රයිම් ග්‍රාමීන් කළුතර ශාඛාවේ සාමාජිකා

ඡායාරූප : සුරංග කුරුප්පුආරච්චි

# ජීවිතයේ සාර්ථකත්වය උදෙසා පස්වැදෑරුම් ක්‍රමවේදයක්......

ජීවිතයට අරුතක්

රටක හෝ ආයතනයක නිති රාමුවක් මගින් මිනිසුන් පාලනය කරන්නේය. ඒවා සමාජගත කිරීමක් තුළින් ක්‍රමානුකූලව පාලනය සිදුකිරීම තුළින් ප්‍රතිඵල අත් කරගත හැක. ඒ බොහෝමයක් නීතිරීති සමාජයේ ආයතනයේ උන්නතිය හා සංවර්ධනය හා පැවැත්ම උදෙසා ගනු ලබන තීරණ වේ. ආගමික සංහිදියාවෙන් ද සංස්කෘතික දායාද වලින් ද මිනිස් ජිවිත පාලනය කිරීම යහපත් වේ. නමුත් මේ හා සබැදි සියලු කාරණා තවකෙකු විසින් අන් අයෙකු වෙත පවරා දි තිබෙන පාලන නීති රීති වන්නට පුළුවන. එහෙත් අප විසින් තම පීවිත සදහා ස්වයං යෝජනාවක් සිදුකර තම තමන්ගේ අභිවෘද්ධිය සදහා නිර්මාණශීලි නිති රිති සමුදායක් යොදා ගැනිම තම ජිවිත සාර්ථකත්වයට මහත් පිටුවහලක් වේ. ඒ නිසාවෙන් සමස්ථ සමාජ ව්‍යුහයම ආවරණය වන පරිදි සකසා ගත හැකි සම්ප්‍රදායෙන් බැහැරව යමක් සිතන්නට මෙලෙසින් සටහන් තබමි.

අප නිරන්තරයෙන් හුරු පුරුදු වී සිටින්නේ කරන්නා වු කාරණයන් ඉතාමත් සාර්ථකව සිදුකිරීමටයි. එය හුදෙක් මිනිසුන්ගේ උදාර ගති ලක්ෂණයක් වේ. නමුත් ඒ තුළින් එක් පැතිකඩයක් හෝ කිහිපයක් පමණක් සාර්ථක වුවද සාර්ථක සමබර එකක් නොවන්නට පුළුවන.

අපේ ජිවිතය කොටස් දෙකකින් යුක්තවේ. එය රැකියා ජිවිතය හා පෞද්ගලික ජිවිතය ලෙස සදහන් කළ හැකිය. මෙලෙසින් පුද්ගලයෙකුගේ රැකියා ජිවිතය පමණක් උපරිම සාර්ථකතක්වය කරා ගෙන යාම පමණකින් පුර්ණ සාර්ථක භාවයක් ඇති නොවේ. පෞද්ගලික ජිවිතය පමණක් සාර්ථක කර ගැනිමද පුර්ණ සාර්ථක භාවයක් නොවේ. එසේ නම් අප මෙය සමබරව තබාගත යුතුව ඇත.

එය රේල් පිල්ලක් මෙනි. දුම්රියක් නිශ්චිත ඉලක්කය වෙත තම ගමන නිම කිරීමට නම් රේල් පාරේ පීළි දෙකම නියමිත ප්‍රමිතියෙන් යුක්තව තිබිය යුතුව ඇත. එමෙන්ම ඒ හා බැඳි සංඥා සියල්ලද නිවැරදිව සැකසි තිබිය යුතුව ඇත. එසේ වුවහොත් නියමිත වේලාවට නිශ්චිත ස්ථානයට ලගා වීම ගැටළුවක් නොවේ.

ඒ නිසා අපි අපගේ රැකියා ජිවිතයත්, පෞද්ගලික ජිවිතයත් සමබරව තබා ගැනිම අපේ සියලු ඉලක්ක ජයග්‍රහනය කර ගැනිමට ඉවහල් වේ. රැකියාවක් ස්වයං රැකියාවක් හෝ තම ව්‍යාපාරයක් කරන සියලු දෙනාගේ බලාපොරොත්තුන් විවිධ වුවද එකම ඉලක්කයක් මත අවසානය පිහිටුවා ගනි. යම් පුද්ගලයෙකුගේ වගකිම් හා යුතුකම් නොපිරිහෙලා ඉටු කර සතුටින් ජිවිත වටිනාකම් වලින් යුක්තව (Life Value ) කටයුතු කිරිමට නම් සිතා බැලිය යුතු පැතිකඩයන් 05 ක් පිළිබදව අවධානය යොමු කරන්නට කැමැත්තෙමි. පස් පවින් වැළකිම සදහා බුදු දහම තුළ පංච ශිලයෙහි පිහිටුවිම සිදු කරනු ලබයි. ජිවිත සාර්ථකත්වය උදෙසාද මෙම පස්වැදෑරුම් ක්‍රමය ඉවහල්වේයැයි විශ්වාස කරමි.

1. රැකියාව
2. පවුල
3. සමාජය
4. පෞද්ගලිකත්වය
5. ආගම

### රැකියාව

ජිවිතයේ තම සියලු කටයුතු සහ පවුලේ සියලු කටයුතු තුළ සාර්ථක අසාර්ථක බව මේ තුළ රැදේ. එමෙන්ම මානසික සතුට අසතුට ද මෙයින් තිරණය වන බව අප දන්නා කරුණකි. ඒ නිසාවෙන් අප නිරන්තරයෙන් රැකියාවේ සාර්ථකත්වය උදෙසා කැපවිමෙන් හා අවංකව වැඩකළයුතු වන අතර දවසින් දවස වසරින් වසර රැකියාවේ සාර්ථකත්වය කරා යා යුතුව ඇත. එසේ රැකියාවේ සාර්ථක අසාර්ථක බව තුළින් පෞද්ගලික ජිවිතයෙත්, පවුල් සංස්ථාවෙත් සාර්ථක අසාර්ථක බව තිරණය වේ. රැකියා ජිවිතයේ සියයට සියයක් සාර්ථක විම තුළින් පෞද්ගලික ජිවිතය සාර්ථක වේ. ඒ නිසා මේ පිළිබදව ඇති අපේ වැඩි අවධානය යොමු කළ යුතුව ඇත.

### පවුල

දස මසක් කුස තුළ රදවා ගෙන ඇති දැඩි කළ ආදරණිය අම්මා හා පෝෂණය කළ ආදරණිය පියාණන්, සහෝදර සහෝදරියන්ගේ අවශ්‍යතාද සොයා බැලිය යුතුව ඇත. කුමන සාර්ථක ස්ථාවරයක සිටියද ඔවුන්ගේ අවශ්‍යතා නොසලකා සිටින යමෙක් සිටි නම් එයද අසාර්ථක පැතිකඩක් වන්නේය. ඔවුන්ව පෝෂණය කිරිමද, මානසික සුවය ඇති කිරිමද සාර්ථක මිනිසුන් තුළ ඇති ගති ලක්ෂණයක් වන්නේය. එමෙන්ම තම ආදරණිය බිරිද, දරුවන් දරුවන්ගේ අධ්‍යාපනය, අනාගත සුරක්ෂිත බව සෙනෙහස ආදරය නිරන්තරයෙන් පෝෂණය කළ යුතු වේ. එසේ නොවන්නේ නම් තමන් කුමන මට්ටමකින් ජිවත් වුවද අසාර්ථක වුවෙකු ලෙස තීරණය කළයුතු වේ. ජිවිත වටිනාකම් තුළ (Life Value) අඩු අගයක්ව පවති. ඒ නිසාවෙන් තම පවුල පිළිබදව නිරන්තර යොයා බැලිමෙන් කටයුතු කළ යුතු බව තරයේ අප තේරුම් ගත යුතුව ඇත.

### සමාජය

අප අවට පරිසරයේ ජිවත් වන සමාජයේ යහපත උදෙසාද අප යම් මෙහෙවරක් කළ යුතුව ඇත. ඉපදි, පැවති, මිය යන කාල පරාසය තුළ අපගේන් යමක් සමාජයට සිදු නොවි ජිවිතයෙන් සමුගැනිම දියපහරක සැදි ගිලි යන දිය බුබුලක් සේ විය හැකිය. මිනිසෙකු ලෙස ඉපිද සමාජයට යම් මෙහෙවරක් කළ යුතුමය. ඒ සදහා සමාජ සුභසාධන වැඩ කටයුතුවල යම් තරමක හෝ නියැලිමෙන් අන් අය වෙනුවෙන් තම කාලය, ශ්‍රමය, ධනය හා දැනුම වැය කළ යුතුය. ඒ තුළින් උතුම් මිනිස් ගුණධර්ම මෙන්ම තම ජිවිත වටිනාකම ළගා කර ගත හැකිවේ. පොදු මහත් සමාජය වෙනුවෙන් අප නිරන්තරයෙන් යුතුකම් හා වගකිම් ඉටු කළ යුතුමය. එයද සාර්ථක පෝෂණය වු ජිවිතයක ලක්ෂණ වන්නේය.

### පෞද්ගලිකත්වය

සියලු දේ සිදුකරන්නට නම් තමා තමා ජිවිතය මනා ලෙසින් පෝෂණය කරගත යුතු වන්නේය. ඒ තුළයි සියලු කටයුතු වල සාර්ථකත්වය පවතින්නේ. නිරෝගීකම, ශක්ති සම්පන්න බව සේම සාරධර්ම වලින් මනා ලෙස පෝෂණය විය යුතුය. එමෙන්ම දැනුම එකතු කර ගත යුතුව ඇත. පෞද්ගලික ජිවිතයේ සාර්ථකත්වය උදෙසා තමන් වෙනුවෙන් තමන් කරගත යුතු දේ තිබේ. ඉහත දෙයට අමතරව තම අනාගත සුරක්ෂිතතාවය වෙනුවෙන් තමන් වෙනුවෙන් මුදල් ඉතිරි කර ගත යුතුවේ. එමෙන්ම අනාගතය පිළිබදව මහත් වු සැලසුමක් සකසා ගත යුතුව ඇත. අප ජිවන මග සදාකාලික නොවුනද හෙට දවස සැලසුම් කිරීම උදාරතර ලක්ෂණයක් වේ. එසේ වැඩකටයුතුකොට තම පෞද්ගලික ජිවිතයේ උන්නතිය සදහාද සියලු කටයුතු සංවිධානය කරගත යුතුවේ.

### ආගම

මානවයාගේ හැදියාව හා සංයමය ඇති කිරීමෙන් මානසික සමබර හා ජිවිතාවබෝධය පිණිස සියලු ආගම් පිහිටුවහලක් වන බව අප දන්නා කරුණකි. ආගමික න්‍යායන් තුළින් හා ඒ හා සබැදි චරිතාපදාන හා කථා වස්තුන් තුළින්ද පරමාදර්ශිව ජිවත්විමට හැකියාව ලැබෙන්නේය. කුමන හෝ ආගමකට එක්ව කටයුතු කිරිමෙන් ශිෂ්ඨසම්පන්න ජිවිතයක් ගොඩනගා ගැනිම හා අධ්‍යාත්මකව සුවයක් එකතු කර ගැනිමට හැකි වන්නේය.

ඉහත කරුණු 5 පිළිබදව අවධානය යොමු කිරීමෙන් පුද්ගලයෙකුගේ ජිවිතය සමබරව පවත්වාගෙන පුර්ණ සාර්ථකත්වයෙන් යුතුව හැම පැතිකඩක්ම සාර්ථක කරගතහැකි වන්නේය. තමා විසින් තම ජිවිතයට එකතු කර ගන්නා නීතියක් හෝ රිතියක් ලෙසින් ඒ පිළිබද වඩාත් අවධානයෙන් යුතුව කටයුතු කිරිම සුදුසු වේ. ඒ නිසා වෙන් අපි ජිවිත ගමන් මගින් ඉතිරි කටයුතු වඩාත්ම සාර්ථක ඉසව්වකට ගෙන යමින් මිය යන විට වඩාත් ඵලදායි පුද්ගලයෙකු ලෙසින් ජිවිතයෙන් සමුගන්නට ලැබේ. සතියකට, මාසයකට වසරකට යන කාලපරිච්ඡේදයක් තුළදි තමා විසින් ඉහත කරුණු 05 වෙනුවෙන් කොතෙක් අවධානය යොමු කළේද යන ස්වයං විග්‍රහයක යෙදිමෙන් තම ජිවිතය වටිනාකම තිරණය කර ගත හැකිය. එමෙන්ම වඩාත් සතුටින් තම තමන් පිළිබදව තෘප්තිමත්ව ජිවත්වන්නට හැකි වන්නේය. වඩාත් ඵලදායි, තෘප්තිමත් ජිවිතයක් ගොඩ නගා ගෙන සාර්ථක ජිවිතයක් ගත කරන්නට සියලු දෙනාටම ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රර්ථනා කරමි.



අනුර උඩවත්ත
අංශ ප්‍රධානි,
පුහුණු

**අන් අය විවේචනය කිරීමෙන් හා ඔවුන්ගේ මතිමතාන්තර වලට එරෙහි වීමෙන් වලකින්න.**



ග්‍රාමීන් ශක්තියයි

# ඇගේ දිරියයි

# පැළ තවානක් පටන් ගන්න තියා ඒ කාලෙ අපි ජීවිතය ගැටගහගත්තෙත් අමාරුවෙන්....

කේ.ඩී. සමන්තා කුමාරි
සාමාජිකා, ප්‍රයිම්ග්‍රාමීන් කළුතර ශාඛාව

ජනාකීර්ණ වු ගාළු පාරේ මග්ගොන නගරය පසු කරගෙන යන කාගේ වුව නෙත සිත එකවර පැහැර ගන්නා මල් තුරු ලතාදියෙන් සෑදුනු බිම් කඩක් වෙයි. විවිධ විසිතුරු මලින් හා විසිතුරු පැල වලින් ගැවසී ගත් මේ බිම් කඩ ඉදිරියෙහි වු නාම ඵලකයක ,නිපුණි පැල තවාන, යන නාමය සනිටුහන් වී තිබේ.

වඩාත් සුන්දර මල් පිපෙන්නේ කටු වලින් ගහන ගොරෝසු නටු අගය. වඩාත්ම සුන්දරව හඳ දැකිය හැකි වන්නේ අහස දෙදරවා ඇද හැළුණු නා කපන වරුසාවකට පසුවය. සුපිරිසිඳු සියපත් පිපෙන්නේ මඩ ගොහොරු වල මිස ගලා යන සුපිරිසිඳු ජලධාරාවන්හි නොවේ. ලොව දිනු බොහෝ මිනිසුන්ගේ මුල් රැළි ඇත්තේ දුක් කඳුලින් පිරුණු කටුක වූ අතීත බිම් මතය. ඒ සිද්ධාන්තය සැමට පොදු නොවුනද නිපුණි පැළ තවානේ හිමිකාරිණිය කේ. ඩී. සමන්තා කුමාරි මහත්මියට නම් ඒ සිද්ධාන්තය පොදුය. මේ ඇය අප හමුවේ පැවසූ ඇගේ දිරිය කතාවයි.

“මගේ ගම බේරුවල. අපේ තාත්තා රස්සාව විදියට කළේ මේසන් වැඩ. අම්මා ජොබ් එකක් කළේ නෑ. මල්ලිලා තුන්දෙනයි මාවයි බලා ගෙන අම්මා ගෙදර හිටියා. හැමදාම වැඩ හම්බනොවුණු මේසන් රස්සාවෙන් අපි පස් දෙනෙක්ව ජීවත් කරවන්න තාත්තාට සෑහෙන යුද්ධයක් කරන්න වුණා. ඒ නිසාම මගේ අධ්‍යාපනික කටයුතු නවවෙනි පන්තියෙන් නතර වුණා.

අපේ ගෙදර මැටියෙන් හදාපු සිංහල උළු හෙවිල්ලපු පුංචි ගෙයක්. ඒ ගේ පිරිලා ඉතිරිලා යන්න තරම් අග හිඟකම් තිබුණා කියලා ඒ අතීතය ආපහු මෙනෙහි කරද්දී මට හිතෙනවා. ඒ පසුබිම තුළ මම අවුරුදු දහනවයේදී විවාහ වුණා. මහත්තයා හෝටල්වල “ලෑන්ඩ් ස්කේපින්” කරන කෙනෙක්. විවාහ වෙලා මහත්තයාගේ ගෙදර පදිංචියට ගියා. එයාගේ හිතේ කාලයක් තිස්සෙම තිබුණු ආශාවක් තමයි පැළ තවානක් ව්‍යාපාරයක් විදියට ආරම්භ කිරීම. ඒ කාලයේ මහත්තයාගේ මාසික පඩිය රුපියල් 3000/- කට වැඩිවුනේ නෑ.. පැළ තවානක් පටන් ගන්න තියා අපි ජීවිතය ගැටගහගත්තෙත් අමාරුවෙන්. ඔය කාලෙම මම සීට්ටුවක් දාලා තිබුණා රු. 36,000/- ක. ඒත් එක්ක පැල තවානක් පටන් ගන්න හිතේ තිබුණු ආශාව ඉස්මතු වුණා. සීට්ටුවෙන් ලැබුණු මුදලින් මම මේ ඉඩමට අවුරුද්දක ඇඩ්වාන්ස් දුන්නා. ඒ 2007 අවුරුද්දේදී. ඉන් පස්සේ ඉතිරි වැඩ ටික කරගන්න අතේ මුදලක් ඉතුරු වුනේ නෑ. ඔය කාලෙම තමයි මට ග්‍රාමීන් සමාගම ගැන දැනගන්න ලැබුනේ. ඒත් මම ණය ගන්න බයෙන් හිටියේ. විශේෂයෙන් බැංකු වලින් ණය ගන්න ගියාම වෙන රස්තියාදුව මම දැනගෙන හිටියා. ඒත් ග්‍රාමීන් සමාගමෙන් ණය ගත්තු මගේ යාළුවෙක්ගෙන් දැනගන්න ලැබුණා ග්‍රාමීන් සමාගමෙන් ණයක් ගන්න ඒ තරම් කරදර වෙන්න ඕන නෑ කියන එක. ඒ ගමන තමයි මමත් ග්‍රාමීන් සාමාජිකාවක් වුනේ. මුලින්ම ගත්තේ රු. 5000/= ණය මුදලක්.ඒණය මුදලින් බෝගන් විලා පැළ අරගෙන විසිතුරු පැල තවානෙ කටයුතු පුංචියට පටන් ගත්තා.ඒ අතරෙම අපි පැළ තවානට අමතරව කොන්ත්‍රාත් අරගෙන උද්‍යාන අලංකරණයත් පටන් ගත්තා. අපි රැයක් දවාලක් නැතිව මහන්සි වුණා. පැළ තවාන ටිකෙන් ටික දියුණු කර ගත්තා. ඒ කටයුතු වලට පසු පස ඉඳන් අපිට යෝධ හයියක් වුනේ ප්‍රයිම් ග්‍රාමීන් සමාගම තමයි.අපි දිගින් දිගටම පියවරෙන් පියවර වැඩ කරමින් ණය මුදල් ලබා ගත්තා. ඒ ගත්තු ණය වරද්දන්නේ නැතුව වෙලාවට ගෙවුවා. දැන් අපි ලඟ 06 දෙනෙක් වැඩ කරනවා. ඒ සේරම ගොඩක් මහන්සිවෙලා වැඩ කරනවා මේ ව්‍යාපාරය දියුණු කරගන්න. උද්‍යාන අලංකරණ කටයුතු වලට අමතරව හෝටල් වගේ ව්‍යාපාර ස්ථාන කිහිපයකටත් අපි අලංකරණය සඳහා කුලියට විසිතුරු පැල ලබා දීලා ඒවා නඩත්තු කිරීම් කරනවා. අද වෙද්දී ප්‍රයිම් ග්‍රාමීන් එකේ ලක්ෂයේ ණය මුදලේ මම ඉන්නේ.”

කවදාවත් කාගේවත් ජීවිත එකවගේ ගෙවී යන්නේ නැත. කන්දක් නැග්ගොත් පල්ලමක් ඇති බව අපි දන්නා සත්‍යයකි. අනේක දුක් පීඩාවන්ගෙන් පරිපීඩිත වූ ජීවිතය ඒ සියල්ල හෙට දවසේ ජයග්‍රාහී සතුටු කඳුල වෙනුවෙන් අත්දැකීම් බවට පත් කරගනු ලබන්නේ ය. සමන්තා සිය ජීවිතයේ ජයග්‍රහණය සොයා යන ගමනට අත් වැලක් වූ ප්‍රයිම් ග්‍රාමීන් සමාගමට සිය හෘදයාංගම කෘතවේදීත්වය පල කරන්නේ සතුටු කඳුළු පිරුණු දෑසිනි. ඇගේ දිරිය ගමනට අත් වැලක් වීමට ලැබීමේ සතුටද සමගින් අපිද ඇයට සුන්දර හෙට දවසක් ප්‍රාර්ථනා කරමු.



සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායා - සුරංග කුරුප්පුආරච්චි



ප්‍රයිම්ග්‍රාමීන් ශාඛාවක වගතුග




# ඇති කරගත්තු කීර්ති නාමය ඉදිරියටත් වර්ධනය කරගැනීම අපේ ප්‍රධාන අරමුණයි....

## - ප්‍රයිම් ග්‍රාමීන් කළුතර ශාඛාව


ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ කළුතර ශාඛාවේ කාර්ය මණ්ඩලය

තුරු ලතා හිස් මුදුන් මතින් ඈතට දිස්වන කළුතර චෛත්‍යයේ කොත් මුදුන සිත තුළ දනවන්නේ පහන් වූ චමත්කාරයකි.දිගු වෙහෙසකර ගමනක අවසානයට අප පැමිණ ඇතැයි සිතට ඉඟි කරන ඒ සොඳුරු දසුනත් කළු ගඟ මහ සයුර තුළ දියවන ඉම පිසඑන සිසිල් සුළඟත් ආගන්තුක සත්කාරයක ආහ්ලාදය ගතට දනවයි. මෙතෙක් මංමාවත් තුළ වූ නිසංසල බව බිඳිමින් කෙමෙන් ඝෝෂාකාරී වන නගරය අළුත් දවසක ඇරඹුමක ප්‍රබෝධය කියා පාන්නාසේය. ඒ ප්‍රබෝධයෙන් පිරිපුන්ව අළුත් දවසක සිය මෙහෙවර අරඹන්නට කඩිසර වන ප්‍රයිම් ග්‍රාමීන් කළුතර ශාඛාවෙහි වගතුග විමසීමට මෙවර අපගේ සංචාරය යොමුවනුයේ නොබෝදා ඔවුන් නව නිවහනකට ප්‍රවිෂ්ඨ වීමේ මංගල කාරණාවද හේතු සාධකයක් ලෙස පසුබිම්හි තබාගනිමිනි. උණුසුම් තේ කෝප්පයක රසය විඳීමෙන් ඉක්බිති ප්‍රයිම් ග්‍රාමීන් කළුතර ශාඛාවේ වග විත්ති විමසන අපගේ පිළිසඳර කතාබහට එහි ශාඛා කළමනාකරු නලීන් ගුණවර්ධන මහතා සිය කටහඬ අවදිකළේ මේ අයුරිනි.

"ප්‍රයිම් ග්‍රාමින් ශාඛා ලැයිස්තුවේ 18 වන තැන හිමි කළුතර ශාඛාව ප්‍රයිම් ග්‍රාමින් ශාඛා ලැයිස්තුවට එක්වෙන්නේ 2003 නොවැම්බර් මාසේ ඉඳන්. කළුතර කියන්නේ ලංකාවේ අනිත් ප්‍රදේශ එක්ක ගත්තාම විවිධත්වයකින් යුත් ව්‍යාපාර සහිත වෙළෙඳ නගරයක් කියලා කියන්න පුළුවන්"ප්‍රයිම් ග්‍රාමින් ශාඛාවක් කළුතර ස්ථාපිත වෙන්නේ 2003 අවුරුද්දේ ඒ කළුතර දකුණෙ පයාගල . පසුගිය 2015 ජනවාරි මාසෙ 29 වෙනිදා අපි අංක 427,ගාළුපාර කළුතර උතුර යන ලිපිනයේ නව ගොඩනැගිල්ලකට ගෙවැදුණේ අපේ ගනුදෙනු කරුවන්ට මෙන්ම මෙහෙයුම් කටයුතු වලට වඩාත් පහසුවක් වෙන්න .

අපේ මධ්‍යස්ථාන ප්‍රචලිතව ඇති ප්‍රදේශයන්හි ඇති ව්‍යාපාර ගැන කතා කළොත් කළුතර නගරයෙන් පිටතට වෙන්න ග්‍රාමීයව වැඩි නැඹුරුතාවක් දක්වන්නේ විශේෂයෙන් තේ, රබර් එළවළු වගාව,ආශ්‍රිත ව්‍යාපාර වලට. ඒ වගේම බේරුවල සහ ඒ ආශ්‍රිත මුහුදු බඩ ප්‍රදේශය තුළ ධීවර කර්මාන්තය, කරවල ආශ්‍රිත ව්‍යාපාර බහුල වශයෙන් දකින්න පුළුවන්.කළුතර පොතුපිටිය පැත්තේ වැඩිපුරම තියෙන්නේ කොහු ඉදල් නිශ්පාදන ව්‍යාපාර. ඒ හැරුණාම අනෙක් ඕනෑම ප්‍රදේශයක දකින්න පුළුවන් සාමාන්‍ය ව්‍යාපාර මේ ප්‍රදේශයෙත් තියෙනවා. අපේ සාමාජිකාවන් මේ විවිධ තරාතිරමේ ව්‍යාපාරවල නිරත වෙනවා. ඔවුන්ට එම ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමට අප සැදී පැහැදී සිටිනවා . අද වන විට අපේ මධ්‍යස්ථාන 129 සාමාජිකාවන් 4250 කට ණය පහසුකම් ලබා දී තියෙනවා. ඔවුන්ගේ ව්‍යාපාර සදහා නිකුත් කර ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 414 ක්.

කළුතර ශාඛාව මගින් මෙහෙයවනු ලබන මධ්‍යස්ථාන විශාල ප්‍රදේශයක් පුරා විහිදී පැතිරී තියෙනවා. කළුතර සිට පානදුර හොරණ පාරේ බටගොඩ මිල්ලනිය දක්වාත්, අළුත්ගම පැත්තට දර්ගා නගරය දක්වාත් මතුගම පාරේ තෙඹුවන දක්වාත්, අපේ මධ්‍යස්ථාන 129 ක් ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා සුළු ව්‍යාපාර සඳහා අප සමාගමේ සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකාවන්හට ණය මුදල් ලබාදෙනවා.

| මධ්‍යස්ථාන සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | නිකුත් කළ ණය ප්‍රමාණය රු. |
|---|---|---|---|
| 129 | 4250 | 20 | රු. මි. 414 |

ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් මගින් හදුන්වාදී ඇති ඉතුරුම් ක්‍රම වූ "යාළු"ළමා ඉතුරුම් ගිණුම මියුලැසි කාන්තා ඉතුරුම් ගිණුම සහ ප්‍රයිම් ඉතුරුම් ගිණුම යන ගිණුම් ක්‍රම සියල්ලත් අභිලාෂ, ස්වශක්ති,ප්‍රයිම් ලෝන්,ඊසි ලෝන් යන ණය ක්‍රමත් අපේ ශාඛාවෙහි ක්‍රියාත්මකයි. සාමාජිකාවන්ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ක්ෂණිකව ලබාදෙන "සහන ණය " ණය ක්‍රමය යටතේ අපේ සාමාජිකාවන්ගේ දූ දරුවන්ගෙ අධ්‍යාපනික අවශ්‍යතා එදිනෙදා වියදම් ආදියට යම් පිළිසරණක් වීමට අපි කටයුතු කරනවා. මේ යටතේ පසුගිය කාලය තුළ රුඃමිඃ 65 මුදලක් සහන ණය වශයෙන් අපි ලබාදුන්නා. සාමාජිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුලේ උදවිය වෙනුවෙන් සලසා ඇති සාමාජිකාව සහ ණය ආරක්ෂණ අරමුදල යටතේ මරණාධාර සහ වන්දි මුදල් වශයෙන් රුපියල් 410000 මුදලක් ලබාදීමට පසුගිය කාලය තුළ අපි කටයුතු කළා.

කළුතර ගත්තාම මම මුලින් කිව්වා වගේ ව්‍යාපාර සෑහෙන ප්‍රමාණයක් එක්කාසු වුණු ප්‍රදේශයක්.ව්‍යාපාරික ස්ථාන වගේම මූල්‍ය පහසුකම් සලසාලන තරගකාරී මූල්‍ය ආයතන විශාල ප්‍රමාණයක් මේ ප්‍රදේශයේ ස්ථාපිතව පවතිනවා. ඒ ආයතන සමඟ අපට තරගයක් නැත්තේ ලංකාවේ පළමුපෙළේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් ලෙසත් ජනතාවගේ විශ්වාසය අඛණ්ඩව රැකගත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් ලෙසත් අප ලබාගෙන ඇති කීර්ති නාමය නිසයි. වසර දොළහකට අධික කාලයක් පුරා ඒ ඇති කරගත්තු කීර්ති නාමය ඉදිරියටත් තවත් වර්ධනය කරගනිමින් පවත්වාගන යාම අපේ ප්‍රධාන අරමුණයි.

**ප්‍රයිම් ග්‍රාමීන් කළුතර ශාඛාවේ නිළධාරී මඩුල්ල**

**ප්‍රාදේශිය කළමනාකරු**
ලලින්ද වීරතුංග
**ශාඛා කළමනාකරු**
නලින් ගුණවර්ධන
**සහකාර කළමනාකරු**
සඳුන් ගුණතිලක
**මූල්‍ය අංශ ප්‍රධානි**
අරවින්ද සඳරුවන්
**ක්ෂේත්‍ර කළමනාකරු**
ගයාත් රුද්‍රිගු
ප්‍රෂාන් ධනංජය
**ක්ෂේත්‍ර විධායක**
නිරෝධ අකලංක
දිගායු චිත්‍රසේන
හර්ෂ මහවත්ත
ෂම්මික පීරිස්
චූලක ජයසිංහ
කසුන් කල්හාර
සඳුන් චානක
ලහිරු රණවීර
ෂෙහාන් කුරේ
ඉසුරු සත්සර
සමිත දර්ශන
**ඉතුරුම් විධායක**
හරිඳු මංජුශ්‍රී
**ගිණුම් සහායක**
ලක්ෂිකා ලක්මාලී
සේනක ප්‍රියන්ත
සම්පත් කුමාර

**ප්‍රයිම් ග්‍රාමින්**
**මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්**
**අංක 427, ගාළුපාර,**
**කළුතර උතුර**
**දුරඃ 0342235293**
**ඊ මේල් kalutara@primegrameen.lk**

සටහන - මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායාරූප - සුරංග කුරුප්පුආරච්චි


**ලලින්ද වීරතුංග**
ප්‍රාදේශීය කළමනාකරු


**නලින් ගුණවර්ධන**
ශාඛා කළමනාකරු


**සඳුන් ගුණතිලක**
සහකාර කළමනාකරු


**අරවින්ද සඳරුවන්**
මූල්‍ය අංශ ප්‍රධානි


**ප්‍රෂාන් ධනංජය**
ක්ෂේත්‍ර කළමනාකරු


**ගයාත් රුද්‍රිගු**
ක්ෂේත්‍ර කළමනාකරු

**සාර්ථකත්වය තව කෙනෙකු හා සන්සන්දනාත්මකව මැන බැලිය නොහැක.**

# ප්‍රයිම් ග්‍රාමීන් සමඟ අපේ ගමන ඉතාම පහසුයි.

ප්‍රයිම් ග්‍රාමීන් සමාගම හා බැඳුණු දිගු කාලීන අතීතයකට හිමිකම් කියන රේණුකා දමයන්ති සිය ව්‍යාපාරික ගනු දෙනුව ප්‍රයිම් ග්‍රාමීන් සමාගම සමඟ අරඹනුයේ 2004 වසරේ සිටයි.බයිට් නිශ්පාදනය සිය ස්වයං රැකියාව ලෙස තෝරාගත් ඇය ව්‍යාපාරිකාවක් වගේ ම තමා දන්නා කියන බයිට් නිශ්පාදනය පිළිබඳව පුහුණු උපදේශිකාවක් ලෙසත් කටයුතු කරනවා.



"අද වෙනකොට හතු පිපෙන්නා වාගේ මූල්‍ය ආයතන කොයිතරම් බිහිවුණත් අපි දන්නා කියන කාලේ ඉඳලා අපි වගේ පුංචි ව්‍යාපාරිකාවන්ට පිහිටට හිටියේ ප්‍රයිම් ග්‍රාමීන් සමාගම විතරයි. එදා ඉඳලා අදවෙනකොට කොයි තරම් කාලය වෙනස් වෙලාද ඒත් ප්‍රයිම් ග්‍රාමීන් සමාගම තවමත් එදා වගේම නොවෙනස් හිතවත් කමින් අපේ ව්‍යාපාර දියුණු කර ගන්න උදව් කරනවා.මේ වෙනකොට මගේ ළඟ පස් දෙනෙක් විතර වැඩ කරනවා. දවසකට අපි බයිට් පැකට් 350 විතර හදනවා. හදන තරමක් දෙන්න පුළුවන් වෙළෙඳපොළක් අපිට තියෙනවා. මම ප්‍රයිම් ග්‍රාමීන් සමාගමෙන් කිහිප වතාවක්ම ණය මුදල් අරන් තියෙනවා.ඒ සෑම ණය මුදලක්ම යෙදෙව්වේ ව්‍යාපාරයට. ජීවිතය සාර්ථක කරගන්න ඕන කියන හැඟීම සහ අධිෂ්ඨානය තියෙන කෙනෙකුට ඒ සඳහා ඇති මාර්ග අපමණයි.අවශ්‍ය වෙන්නේ සැලසුමක් ඇතිව එම මාර්ගයේ ගමන් කිරීම පමණයි . ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ නිබඳ ආශීර්වාදය ලබන අපි වගේ අයට ඒ ගමන වඩාත් පහසු වෙන වග අමුතුවෙන් කියන්න ඕන නැහැනෙ.

**රේණුකා දමයන්ති, මොල්ලිගොඩ, වාද්දුව.**

# ව්‍යාපාරයක් සාර්ථක වෙන්න ඊට ආධාර උපකාර ලබාදෙන ආයතනය විශේෂයෙන් වැදගත් වෙනවා....






**බී**ම පැකැට් නිශ්පාදනය ස්වයං රැකියාව ලෙස තෝරාගත් ශලිනි දීප්තිකා ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වනුයේ 2011 වසරේදී. ඒ බීම පැකැට් නිශ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ණය මුදලක් ලබා ගැනීමේ අරමුණෙන්. ශලිනි ඇගේ ව්‍යාපාරයට ප්‍රයිම් ග්‍රාමීන් වෙතින් ලැබුණු ධෛර්ය හා ශක්තිය පිළිබඳව අප හමුවේ සිය හඬ අවදි කළේ මෙහෙමයි. ''අපි කිරි, පළතුරු, වර්ග යොදා ගෙන තමයි මේ බීම පැකට් නිශ්පාදනය කරන්නේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිළදී ගැනීමේ අරමුණෙන් තමයි මම ප්‍රයිම් ග්‍රාමීන් සමාගමෙන් මුල්ම රුපියල් 35000 ණය මුදල ලබා ගන්නේ.ඉන් පස්සෙ රු 60000, 70000 ආදී වශයෙන් ණය මුදල් ලබාගත්තා.කිරි පැකැට් නිශ්පාදනය සඳහා මා ළග තව හතර දෙනෙක් වැඩ කරනවා.හදන ඒවා කඩවලට දාන්න ගෙනියන්නෙ අයියයි තාත්තයි. ඇත්තටම අපේ නිශ්පාදන සඳහා හොඳ ඉල්ලුමක් තියෙනවා. ඒ ඉල්ලුම අපිට සපුරන්න තවම පුළුවන් වෙලා නෑ.ප්‍රයිම් ග්‍රාමීන් එකෙන් ළඟදීම ගත්තේ 150000 මුදලක්.ඒ මුදල යෙදෙව්වෙ අධි ශීතකරණයක් මිළදී ගැනීම සඳහායි. ව්‍යාපාරයක් සාර්ථක වෙන්න ඒ ව්‍යාපාරයට ආධාර උපකාර ලබාදෙන ආයතනය විශේෂයෙන් වැදගත් වෙනවා. ඒ අතින් ගත්තාම අපේ දියුණුව පසුපස සිටින ප්‍රයිම් ග්‍රාමීන් සමාගම අපිට යෝධ හයියක්.

**බී.ශලිනි දීප්තිකා**
**රාගලවෙල, හල්කඳවිල**
**පයාගල.**

# පහසුවෙන් ණය ලබාගත හැකි ආයතනයක් ලෙස ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ලබාගෙන ඇති කීර්ති නාමය අති විශාලයි



කොහු කඹ, නයිලෝන් කඹ වගේ කඹ වර්ග අපේ ජීවිතයට එතරම් ආගන්තුක නොවුණත් නූල් කඹ කියන වචනය පවා අප සිත් තුළ දනවන්නේ ආගන්තුක හැඟීමක්. සවි ශක්තිය අතින් වගේම පෙනුම අතිනුත් සුවිශේෂීත්වයක් ගන්නා ලණු කඹ නිශ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන හර්ෂණී අපට හමුවූයේ වාද්දුව පොතුපිටිය ප්‍රදේශයේදී. " අපි මේ ව්‍යාපාරය පටන් අරන් දැන් අවුරුදු නවයක් විතර වෙනවා. ගාමන්ට් වලින් නූල් තොග ගණනට අරන් තමයි අපි නූල් කඹ හදන්නේ. මේක ඒ තරම් ප්‍රචලිත වුණු ව්‍යාපාරයක් නොවුණු නිසා හොඳ වෙළෙඳ පොළක් තියෙනවා. මේ ව්‍යාපාරයේ නියැලෙද්දි අපිට වැඩිපුර මුදල් අවශ්‍ය වෙන්නේ නූල් මිළදී ගැනීම සඳහායි. මම ප්‍රයිම් ග්‍රාමීන් සමාගම සමඟ සම්බන්ධ වෙන්නේ ස්වයං රැකියා සඳහා වඩාත් පහසුවෙන් ණය ලබාගත හැකි ආයතනයක් ලෙස ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ලබාගෙන ඇති කීර්ති නාමය නිසයි. ඒ කිව්වා වගේම මම කිහිප වතාවකදීම ප්‍රයිම් ග්‍රාමීන් සමාගමෙන් ණය මුදල් ලබා ගත්තා. ඒ මුදලින් ව්‍යාපාරය සෑහෙන මට්ටමකට දියුණු කරගන්න වගේම ඒ නිසා තවත් කිහිප දෙනකුට රැකියා අවස්ථා ලබාදෙන්නත් අපිට අද පුළුවන් වෙලා තියෙනවා.අද වෙනකොට ණය දෙන ආයතන කොයි තරම් තිබුණත් නියම සොයා බැලීමක් ඇතිව අවශ්‍ය ණය මුදල අවශ්‍ය වෙලාවට ලබා දෙන්නට කටයුතු කරන ආයතනයක් විදිහට ප්‍රයිම් ග්‍රාමීන් සමාගම පිළිබඳව අපේ හිතේ තියෙන්නේ විශාල විශ්වාසයක්.

**ජේ.එච්.හර්ෂණී, පොතුපිටිය, වාද්දුව.**

# අභිලාෂ ණය ක්‍රමය අපට වඩාත් පහසු සහ සහනදායී ණය ක්‍රමයක්

PrimeGrameen අභිලාෂ
හෙටක් දිනන මගක්

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගම හඳුන්වා දී ඇති ණය සැලසුම් ක්‍රම කිහිපය අතරින් "අභිලාෂ" ණය සැලසුමට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්. වඩාත් පහසුවෙන් හා ඉක්මණින් ලබාගත හැකි ණය ක්‍රමයක් ලෙස ජනතා ආකර්ශනය නොමදව ලබා ඇති අභිලාෂ ණය ක්‍රමය තුළින් සිය ව්‍යාපාරික ඉලක්ක සාක්ෂාත් කරගත් ව්‍යාපාරිකයින් අතරින් තවත් එක් සාර්ථක ව්‍යාපාරිකාවක් පසුගියදා අපට මුණ ගැසුණා. ඇය රීටා රත්ගමගේ. දර්ගා නගරයේ පිහිටා ඇති සජාන් සැලෝන් අවුරුදු 30 පුරා ප්‍රදේශය තුළ ප්‍රචලිත වූ නාමයක් දිනාගෙන ඇති ව්‍යාපාරික ස්ථානයක්.රූපලාවන්‍ය කටයුතු සේම මනාලියන් හැඩගැන්වීම පිළිබඳව වූ පාඨමාලා නොමිලයේ පවත්වනු ලබන සජාන් සැලෝන් ආයතනයේ කටයුතු වඩාත් පුළුල් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාව මත ණය මුදලක් ගැනීමේ අවශ්‍යතාව මතුවූ බව එහි හිමිකාරිණිය වූ රීටා රත්ගමගේ මහත්මිය අප සමඟ පැවසුවා.



"සැලෝන් එකේ කටයුතු තවත් පහසුවෙන් කරගෙන යාමේ අවශ්‍යතාව මත අපිට ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය වුණා. සුළු හා මධ්‍ය පරිමාණ ණය ලබාදෙනු ලබන මූල්‍ය ආයතන කොතෙකුත් තිබුණත් ඒ සියල්ලටම වඩා ප්‍රයිම් ග්‍රාමීන් අභිලාෂ ණය ක්‍රමය අපට වඩාත් පහසු සහ සහනදායී ණය ක්‍රමයක් කියලා මම හිතුවා. ඒ නිසා වෙනත් බැංකුගානෙ රස්තියාදු නොවී අභිලාෂ ණය ක්‍රමය යටතේ මුලින්ම රුපියල් ලක්ෂ තුනක් ලබාගත්තා. ඉදිරියේදිත් ප්‍රයිම් ග්‍රාමීන් අභිලාෂ ණය මුදල් ලබාගෙන ව්‍යාපාරය තව වැඩිදියුණු කර ගැනීම තමයි අපේ බලාපොරොත්තුව"

**සජාන් සැලෝන්, මතුගම පාර, දර්ගා නගරය.**




**පරාජය කියා දෙයක් නොමැතිබව තේරුම් ගැනීම සාර්ථකත්වයයි.**







# ඔබ (නො)දන්න මම

## ප්‍රියන්ත දිසානායක
## ප්‍රාදේශීය කළමනාකරු, අම්පාර ප්‍රාදේශිකය

**සම්පූර්න නම :-** දිසානායක මුදියන්සේලාගේ ප්‍රියන්ත ප්‍රේමලාල්

**උපන් දිනය :-** 1978.08.24

**පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :-** මම පාසැල් දෙකකට ගියා.එකක් අම්පාර පරගහකැලේ මහා විද්‍යාලය.ඒකට 8 පංතියට වෙනකම් ගියා. ඊට පස්සේ අම්/ගාමිණි මහා විද්‍යාලයට. ඒකේ උසස්පෙළ දක්වා ඉගෙන ගත්තා. මේ පාසැල් දෙකෙන් මම වඩාත්ම කැමැති ගාමිණි මහා විද්‍යාලයට. ඒක මිශ්‍ර පාසැලක්. ඒකේ උසස්පෙළ පංතියට මම වඩාත් කැමැතියි. එකක් අපේ පාසැල් ජීවිතයේ අවසාන කාලය ළඟා වෙද්දි අපිට ඒ ජීවිතයෙන් සමු ගන්න වෙනවා කියන හැඟීමත් එක්ක දැනෙන කම්පනය සහ ඒ ජීවිතයේ රැඳී ඉන්න තියෙන ආශාව. ඒකටම එකතු වුණු තව හැඟීමක් තිබුණා ඒ තමයි මගේ පාසැල් ප්‍රේමය. මේ සේරමත් නිසා මම ගාමිණි විද්‍යාලයට කැමැතියි.

**විෂය :-** ව්‍යාපාර සංඛ්‍යානය. 97 දී තමයි ඒ විෂය අපිට හඳුන්වලා දුන්නේ. අළුත් විෂයක් නිසා මම ඒ විෂය හුඟක් ආශාවෙන් හැදෑරුවා.

**ක්‍රීඩාව :-** ක්‍රීඩා වලට ඒ කාලේ ඉඳන්ම මගේ ඒ තරම් කැමැත්තක් නෑ.

**පාසැල් කාලෙදි සිද්ධ වුණු අමතක නොවෙන සිදුවීම :-** අපිට ව්‍යාපාර සංඛ්‍යානය විෂය උගන්වන්න ආපු ගුරුතුමියට දරුවෙක් ලැබෙන්න හිටියා. මට මතකයි ඇය අපේ ඉගැන්වීමේ කටයුතුත් කළේ තරමක අමාරුවෙන්. ඒත් ඒ ගුරුතුමිය කවදාවත් නිවාඩු ගත්තේ නෑ.තමන්ගේ වේදනාව අමතක කරලා ඇය ගුරු වෘත්තිය වෙනුවෙන් සහ අපේ අනාගතය වෙනුවෙන් කැපවුණා. උසස්පෙළ විභාගෙ ආසන්නයේමයි ඇගේ තාත්තගේ මරණය සිද්ධවුණෙත්.ඒ මරණෙ වෙලාවේ ඇයට උදව් කරන්න අපි ගෙදරට ගිය වෙලවෙ ටීචර් අපිට බැනලා එලවා ගත්තා පාඩම් වැඩ අතපසු කරන්න එපා කියලා. ඒ වගේ කැපවීමකින් අපි ගැන හොයා බලපු ආදරණීය ගුරුවරයෙක් තවත් නැති තරම්.

**පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :-** කවදාහරි මේ වගේ කෙනෙක් වෙනවා කියලා හිතේ අදහසක් තිබුණෙ නෑ. ඒත් පෞද්ගලික අංශයේ රැකියාවක් කරන්න හිතේ ආශාවක් තිබුණා.

**මුල්ම ජොබ් එක හොයාගන්න වින්ද දුක :-** මගේ අම්මා තාත්තා දෙන්නම කළේ ගොවිතැන්. ඒ නිසාම අපිට දැනෙන තරමේ ආර්ථික ප්‍රශ්න තිබුණෙ නෑ. මම මුල්ම රැකියාවට යොමුවෙන්නේ මගේ පාසැල් කාලය අවසානයත් එක්කයි. ඒ ඉස්කෝලෙන්ම අපිව යොමුකරපු ජොබ් එකක්.සී.ටී.සී ඊගල් රක්ෂණ සමාගමේ රක්ෂණ නියෝජිතයෙක් විදිහට තමයි මම මුලින්ම රැකියාව කළේ. ඒ රස්සාව කරකර ඉන්දැද්දි අම්පාරේ ග්‍රාමින් ශාඛාවක් ආරම්භ කරන්න දයා ඇපරල් එකෙන් ඉන්ටර්වීව් එකක් කෝල් කළා. මම ඒකට ගිහින් සිලෙක්ට් වුණා. ශාඛා කළමනාකරු විදිහට මම වැඩ භාර ගත්තා. මාත් එක්ක තව පස්දෙනෙක් එදා අම්පාර ශාඛාවට තෝරා ගත්තා.ප්‍රධාන ශාඛාවේ වජිර ඒ අතරින් එක්කෙනෙක්.

**ග්‍රාමින් ජීවිතේ අමතක නොවන සිද්ධිය :-** සෙලින්කෝ සමාගම ක්‍රයිසිස් එකට අහුවෙලා අපේ සේවකයන්ගේ රැකියා අස්ථිර තත්වයට පත්වෙච්ච කාල වකවානුව මට කවදාවත් අමතක කරන්න බැරි කාලවකවානුවක්.අපිත් එක්ක එකට හිටිය හුඟ දෙනෙක් මේ සමාගමෙන් අයින් වෙලා වෙනත් රැකියා හොයාගෙන ගියා. අපේ වැටුප පවා අඩු වුණා. ඒ සේරම ප්‍රශ්නත් එක්ක හෙටක් ගැන අවිනිශ්චිතව ගෙවූ කාල වකවානුවකදී ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගම ග්‍රාමින් සමාගම භාර ගන්න බව දන්වන්න අපිව මොරටුවට කැඳවපු දවස... ඒ සතුටු ආරංචිය කණට වැටුණු මොහොත...ඒ සමස්ථ සිද්ධිදාමයම මට කවදාකවත් අමතක වෙන්නේ නෑ.

**ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය :-** මගේ දුව නිෂාදී අමන්ද්‍යා ඉපදුණු දවස... 2007 අගෝස්තු 21.එදා තමයි මට සතුටුම දවස. දුකම දවස තමයි විවාහ වෙලා අවුරුදු දෙකකට විතර පස්සෙ අපිට දරුවෙක් ලැබෙන්න හිටියා. ඒත් මාස අටේදී විතර මව් කුසේදීම ඒ දරුවා නැති වුණා. ඒ දවස අපේ බලාපොරොත්තු සියල්ල අපිට අහිමි වුණ දවස විදිහටයි මට දැණුනේ.

**හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා:-** මම හැම කෙනාවම ඕනවට වඩා විශ්වාස කරන්න ගිහින් එක පාරක් දෙපාරක් නෙවෙයි කිහිප වතාවක්ම පාඩම් ඉගෙන ගත්තු කෙනෙක්. මේ වැරැද්ද නිවැරදි කරගන්න අවශ්‍ය වුනත් තවමත් පුළුවන් වෙලා නෑ.

**පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :-** ආදර හැඟීමක් කියන දේ මුලින්ම හිතට දැණුනාම හරියට කරන්ට් එකක් වදිනවා වගේ දැනෙනවා. ඒ වගේ හැඟීමක් මට මුලින්ම දැනුණෙ උසස්පෙළ පංතියෙදි. ඒත් ඒ හැඟීම ඇයට නොකියා හිතේ තියාගෙන මාස හයක් විතර හිටියා. බැරිම තැන මම ආදරේ ප්‍රකාශ කරපු ගමන්මත් එයා එක පාරටම හා කිව්වෙත් නෑ.කාලයක් අපි යාළුවො වගේ ඇසුරු කළා. ඒත් ඉස්කෝලෙන් අස්වුණාට පස්සෙ ඇයට ගෙදරින් ගෙනාපු යෝජනාවකට කැමැතිවෙන්න සිද්ධ වුණා.අපි සුහදව කතාබහ කරලා වෙන්වුණා.

## "ඒ වගේ හැඟීමක් මුලින්ම හිතට ඇතිවුණාම හරියට කරන්ට් එකක් වදිනවා වගේ දැනෙනවා..."

**එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :-** මම බඳින ගෑණු ළමයා මෙන්න මේ වගේ වෙන්න ඕන කියලා මගේ හිතේ තිබුණු රූපය හැබැහින් දකින්න ලැබුණා වගේ දෙයක් ඒ ළමයා දැක්ක මුල්ම වතාවෙ මට දැණුනා. මම විවාහ වුණෙත් ආදර සම්බන්ධතාවකින්. ඇය මට ආදරණීය බිරිඳක්.

**රටේ නීති ක්‍රියාත්මක කරවීමේ විධායක බලතල ඔබට හිමිවුනොත් මුලින්ම ක්‍රියාවට නංවන නීතිය:-** මම හිතන්නේ අපේ රටේ හුඟක් වැරදි සිද්ධවෙන්නේ අධිකරණයේ ස්වාධීනත්වය ගිලිහී යාම නිසයි.මම අධිකරණය කාටත් සර්ව සාධාරණ තැනක් බවට පත්කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කරනවා.

**ඔබේ ප්‍රියතම ගායකයා :-** ප්‍රියා සූරියසේන

**ගීතය :-** "සුදු පරෙවි රෑන සේ...." පාසැල් ජීවිතයට සමීප අත්දැකීමක් නිසා ඒ ගීතයට වඩාත් කැමතියි

**චිත්‍රපටිය :-** චිත්‍රපටියක් කියලා එහෙම විශේෂයෙන් සඳහන් කළ හැකි චිත්‍රපටියක් නැහැ.

**කෘතිය :-** "මීනා"නවකතාවට කැමැතියි.

**අනාගත ඉලක්කය :-** රැකියාව පැත්තෙන් ගත්තොත් ආයතනය වෙනුවෙන් කළ හැකි උපරිම මෙහෙය ආයතනයට ලබාදීම. පෞද්ගලික ජීවිතය පැත්තෙන් ගත්තොත් දරුවන්ට හොඳට උගන්වලා ඔවුන්ට යහපත් අනාගතයක් හිමිකරදීම සහ පවුලක් විදිහට සතුටින් ජීවත් වීම.

සටහන
මංජුල හෙට්ටිආරච්චි

එළඹෙන සෑම බාධාවක්ම දියුණුවට සාධකයක්වේ.

## micro credit සංකල්පය පිළිබඳ සරල කියැවීමක්

# මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදයේ ආරම්භය හා විකාශනය. - 5 කොටස

# තනි පුද්ගල ණය ක්‍රමයේ ඇති අභියෝගතා



**ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ කළමණාකාර අධ්‍යක්‍ෂක / ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.**



මයික්‍රෝ ෆයිනෑන්ස් ක්‍රමවේදය තුළ වූ සරළ බව නිසාම බොහෝ විට තනි පුද්ගල ණය යම් යම් ගැටළුකාරී තත්වයන් නිර්මාණය කරනු ලබයි.මෙහි ඇති ප්‍රධානම අභියෝගය වන්නේ ණය ලබා දීම සඳහා දරනු ලබන වියදම සහ එම ණය නැවත අය කර ගැනීමේ දී ඇති අවධානම අතර වූ ගැටළුකාරී ස්වාභාවයයි. එනම් ණය මුදලක් ලබාදීමේදී ආයතනයක් විසින් ලබාදෙනු ලබන ණය මුදලට අමතරව මෙහෙයුම් ක්‍රියාවලිය සඳහාද තවත් විශාල පිරිවැයක් දරනු ලබයි. ණය ලබාගනු ලබන පුද්ගලයකු මොනම හේතුවක් මත හෝ සිය ණය මුදල නැවත නොගවා සිටියහොත් එය ආයතනයට කෙසේ බලපානු ඇද්ද යන්න වටහා ගැනීම අසීරු නැත.

ලෝකය තුළ ක්‍රියාත්මකව පවත්නා ඕනෑම මූල්‍ය ආයතනයක් ණය ලබාදීමේදී උක්ත ගැටළුවට මුහුණ දීම ස්වාභාවිකය. එහෙත් මූල්‍ය සමාගමක් හැම විටකම උත්සහ කළ යුත්තේ මේ අවධානම අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග කෙරෙහිය. එසේ නොවුණහොත් අදාල මූල්‍ය ආයතනය කඩා වැටෙන්නට පවා ඉඩ ඇත. ලෝකයේ මෙවන් අවස්ථාවන්ට ලක්ව බිඳ වැටුණු මූල්‍ය ආයතන පිළිබඳ නිදසුන් හමුවනුයේ ඉඳහිටක නොවේ.

මූල්‍ය ආයතනයක් ණය මුදලක් ලබාදීමේදී ණය ඉල්ලුම් කරු සමඟ ගිවිසුමක් අත්සන් කරනු ලබයි. මෙසේ ගිවිසුමක් අත්සන් කරනු ලැබූවද ඒ තුළ සියයට සියයක සුරක්ෂිත බවක් අපේක්ෂා කළ නොහැකිය. එනම් මූල්‍ය ආයතනයක් අද දවසේ ලබාදෙනු ලබන ණය මුදලක් වෙනුවෙන් දරනු ලබන්නේ අනාගත අවිනිශ්චිතතාවයකි.මෙය තවත් අයුරකින් පැහැදිලි කළහොත් ණය ලාභියා ලබාගනු ලබන ණය මුදල යොදවනු ලබන ආකාරය අනුව ඔහුගේ ණය නැවත ගෙවීමේ හැකියාව තීරණය කරනු ලබයි. ව්‍යාපාරයක් සඳහා ණයක් ලබාගත් පුද්ගලයකු එම ණය මුදල නිසි පරිදි ආයෝජනය නොකළහොත් හෝ කරන ලද ආයෝජනයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වුවහොත් හෝ එහි අවසාන ප්‍රතිඵලය එල්ල වන්නේ ණය ලබාදුන් ආයතනය වෙතය.එනම් එවිට ණය ලාභියා ණය ගෙවීම පැහැර හරින තත්වය කරා ඉබේම තල්ලු වී යා හැකිය. අනෙක් අතට ස්වාභාවික ව්‍යසනයන් හේතුවෙන්ද ණය ගෙවීම පැහැර හැරීමට සිදුවීමට පුළුවන.මේ සියළු කාරණාවන්ට අමතරව උවමනාවෙන්ම ඇතැම් පුද්ගලයන් ණය නැවත නොගෙවා සිටීමට ඉඩ ඇත. මේ කුමන තත්වයක් මත හෝ ණය නැවත නොගෙවා සිටීමට ණය ඉල්ලුම්කරු කටයුතු කරයි නම් එය මූල්‍ය ආයතනයට බලපාන්නේ ණය අවධානමක් (Credit Risk) විදිහටය.

ණය මුදලක් ලබාදීමේදී ණය ලබාදෙන්නා සහ ණයලාභියා අතර විශ්වාසයක් ගොඩනැගිය යුතුය. එහෙත් යම් හෙයකින් ණය ලබාදන්නා විසින් ණය ලාභියා පිළිබඳ ඇති කරගත් විශ්වාසනීය ආකල්පය සාවද්‍ය වූවක් නම්... මේ නිසා සෑම විටම ණය ලබාදෙනු ලබන ආයතනය ණය ලාභියා පිළිබඳව ඇති කරගත යුත්තේ නිවැරදි දත්ත මත පදනම් වූ විශ්වාසයකි. සාමාන්‍යයෙන් මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගම්හි ඇති වත්කම්වලින් 80% ලබාදුන් ණය කළඹ මත පදනම් වේ. ඒ අනුව මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගමක ණය නැවත අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුනහොත් එය ආයතනයේ පැවැත්මට සෘජුවම බලපෑම් කරනු ලබයි.

### ණය අවධානමක් ඇති වීමට හේතු

#### 1. තොරතුරු

අප ජීවත්වනුයේ විනිවිද භාවයකින් යුත් ලෝකයක නොවේ. අපත් සමඟ සිටින අන්‍යන්ගේ සෑම තොරතුරක්ම අපට දැනගන්නට ලැබෙන්නේ නැත. දන්නා තොරතුරු පවා සියයට සියයක් නිවැරදි ඒවා නොවන්නට පුළුවන. ණය දෙන්නා සහ ණය ලබාගන්නා අතර ඇත්තේද මෙබඳුම තත්වයකි. මේ හේතුවෙන් ණයලාභියා පිළිබඳ මූල්‍ය ආයතනය දන්නා තොරතුරු සියයට සියයක් නිවැරදි ඒවා නොවේ. තොරතුරු ගලා ඒමේ අසමතුලිතතාවය මීට ප්‍රධාන හේතුවය.ණය ලාභියා විසින් සිය ගනුදෙනු වල නියම ස්වාභාවය සහ අනාගතයේදී ඔහු මුහුණ පෑ හැකි අවධානම් තත්වයන් පිළිබඳව නිවැරදි හෙළි දරව්වක් කිසි වටෙකත් කරන්නේ නැත. ණය දෙනු ලබන මූල්‍ය ආයතනයන් මෙම තත්වයන් පිළිබඳව සොයා බැලීමක් කරනු ලැබූවද එමඟින් සියයට සියයක නිවැරදි දත්ත අනාවරණයක් බලාපොරොත්තු විය නොහැකිය.මේ නිසා ණය ඉල්ලුම් කරන්නා පිළිබඳ සියළු සත්‍ය තොරතුරු හෙළි කර ගැනීමේ අභියෝගයට මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගම් ඇතුළු ණය ලබාදෙනු ලබන සියළුම ආයතන සහ පුද්ගලයන් මුහුණ දෙනු ලබන්නේය.

---

# ප්‍රයිම් ග්‍රාමීන් සමගම, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සම්මානයට පාත්‍ර වෙයි



ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සියළුම බැංකු සහ මූල්‍ය ආයතන වල සිදුකෙරෙන ගනුදෙනු පිළිබඳව අධීක්ෂණය කරනු ලබන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය මඟින් සිය විසිපස්වන සංවත්සරය නිමිතිකරගනිමින් ඉතිහාසයේ පළමුවරට සිය කාර්යාංශය තුළ ලියාපදිංචි බැංකු සහ මූල්‍ය ආයතන අනූ එකක් අතරින් සුවිශේෂී ආයතන හයක් ඇගයීමට ලක්කරන ලදි.

මෙසේ ඇගයීමට ලක්කරන ලද්දේ බැංකු සහ මූල්‍ය ආයතන අනූ එක අතරින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත සිය ගනුදෙනු කරුවන්ගේ ණය තොරතුරු නිසි පරිදි සපයන සහ එකී තොරතුරු නිසි පරිදි යාවත්කාලීන කරනු ලබන ආයතන හයකි.ගනුදෙනු කරුවන්ගේ සංඛ්‍යාව මත කරන ලද වර්ගී කරණයට අනුව ගනුදෙනු කරුවන් ලක්ෂයත් ලක්ෂතුනත් අතර වර්ගී කරණය යටතේ වූ සියළුම බැංකු සහ මූල්‍ය ආයතන අභිබවමින් ප්‍රථමස්ථානය දිනා ගැනීමට ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගම සමත්විය. මහා බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මේ අවස්ථාවට සහභාගී වූ අතර එතුමන් අතින් ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා සහ කළමනාකරු - අනුකූලතා, උෂාන් හපුආරච්චි මහතා සම්මානයට පාත්‍ර වූ මොහොත මෙසේ ඡායාරූපයට නැගී තිබිණි.

**අපට අවශ්‍ය පුද්ගලයා තව කෙනෙකු තුළින් දැකිය නොහැක.**

# සම්බුදු තෙමඟුල සමරා ප්‍රයිම් ග්‍රාමින් දන්සැල් රටපුරා

ශ්‍රී සම්බුද්ධ තෙමඟුල සමරා රටපුරා පැවැත්වුණු විවිධ ආමිෂ සහ ප්‍රතිපත්ති පූජාවන්ට සාපේක්ෂව ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ ප්‍රධාන කාර්යාලය සහ දීප ව්‍යාප්ත ශාඛා ජාලයෙහි ශාඛාවන් විසින් දන්සැල් ගණනාවක් සංවිධානය කර තිබෙනු දක්නට ලැබුණි.එසේ දන්සැල් සංවිධානය කර තිබූ ශාඛා අතර වැලිමඩ, වත්තල, කඩුවෙල සහ මතුගම ශාඛාවන් විසින් සිය දන්සැල් පිළිබඳ ඡායාරූප මෙසේ අප වෙත එවා තිබිණි.


වැලිමඩ


වත්තල


කඩුවෙල


මතුගම

## ප්‍රයිම් ග්‍රාමින් ප්‍රධාන කාර්යාලයේ අනුග්‍රාහයෙන් මඤ්ඤොක්කා දන්සැලක්

ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්හි ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය මඟින් දෙවන වරට සංවිධානය කරන ලද මහා මඤ්ඤොක්කා දන්සැල මැයි මස 05 වෙනි දින  සවස 4.30 සිට රාත්‍රිය වෙනතුරු නුගේගොඩ නාවල පාරේ ප්‍රයිම් ග්‍රාමින් ප්‍රධාන කාර්යාලය ඉදිරිපිටදී සුවිශාල ජනකායකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.



සත්කාරක සේවා

## ප්‍රයිම් ග්‍රාමීන් අනුග්‍රාහයෙන් උඩුහාවර මහා විද්‍යාලයට නාම පුවරුවක්....




උඩුහාවර ශ්‍රී මේධානන්ද මහා විද්‍යාලය කියන්නේ වැලිමඩ ඉඳන් කිලෝමීටර් පහලොවක් විතර දුරින් තියෙන දුෂ්කර පාසැල් ගොන්නට වැටෙන පුංචි ඉස්කෝලයක්. දූ දරුවෝ  800 පමණ අධ්‍යාපනය ලබන මේ පුංචි ඉස්කෝලෙට මෙතෙක් කලක් නොතිබුන අඩුවක් පසුගිය මාර්තු 25 වෙනිදා සම්පූර්ණ වුණා. ඒ තමයි , "උඩුහාවර ශ්‍රී මේධානන්ද මහා විද්‍යාලය" , යනුවෙන් සඳහන් වු නාම පුවරුවක් නොමැතිකමේ අඩුව.

උඩුහාවර මහා විද්‍යාලයේ  විදුහල්පතිතුමාගේ ඉල්ලීමක් අනුව පසුගියදා  ඒ මහැගි සත්කාරයට උරදුන්නේ ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනැන්ස් සමාගම. ප්‍රයිම් ග්‍රාමීන් වැලිමඩ ශාඛාව හරහා ප්‍රධාන කාර්යාලයට ලැබුණු එම ඉල්ලීමට අනුමැතිය දෙන්නට ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ විධායක අධ්‍යක්ෂකතුමන් දෙපාරක් හිතුවේ නැහැ. ප්‍රයිම් ග්‍රාමීන් යාළු ළමා ගිණුමේ අනුග්‍රාහත්මක දායකත්වය යටතේ ඒ සඳහා යන ඇස්තමේන්තු ගත මුදල ලබා දීලා අදාල නාම පුවරුවේ  වැඩ කටයුතු සම්පූර්ණ කෙරුනේ 2015 මාර්තු මාසයේ මැද - මාර්තු 25 වෙනිදා ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ ප්‍රාදේශිය කළමනාකරු ගාමිණී ආරියසිංහ,ශාඛා කළමනාකරු රුවන් අබේසේකර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිළධාරීන් උඩුහාවර මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා,  ඌව පරණගම අධ්‍යාපන කලාප කාර්යාලයේ කලාප අධ්‍යක්ෂකතුමා, හිටපු විදුහල්පතිතුමා, ගුරුභවතුන් සහ දූ දරුවන්ගේ සහභාගීත්වයෙන් මේ නාමපුවරුව  නිරාවරණය කිරීම නිමිත්තෙන් පුංචි චාම් උත්සවයක් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණා. විද්‍යාලයට මෙතෙක් අඩුවක්ව පැවැති මේ සත්කාර්යට උරදීම වෙනුවෙන් සිය අසීමිත භක්ත්‍යාදරය පාසලේ දූ දරුවන් වෙනුවෙන් ප්‍රයිම් ග්‍රාමින් සමාගමට පුදකර සිටින බව විදුහල්පතිතුමන් විසින් සිය කතාවේදී කෘතවේදීව ප්‍රකාශකර සිටියේ කෘතඥපූර්වක බව කැටිකරගත් හැඟීම්බර ස්වරයකින්.

**තම දරුවන් ඉදිරියේ පිට දරුවන් අගය කිරීම ප්‍රවේසමෙන්.**



# ව්‍යාපාරික කටයුතු හා බැඳි උපකාරක සේවා

16 කොටස

**කළමනාකරණයේදී ගැටළුවක් යනු**

අපේක්ෂිත ආකාරයට වඩා වෙනස් ආකාරයට කටයුතු සිදුවීම ගැටළුවකි. එනම් අපේක්ෂිත තත්වයත්, පවතින තත්වයත් අතර වෙනසක් පවතී නම් එය ගැටළුවක් ලෙස හැඳින්වේ. ගැටළුවක් සරල වුවද සංකීර්ණ වුවද කලමනාකරුවන් එයට විසඳුම් දිය යුතුය. ගැටළු විසඳීම සඳහා තීරණ ගත යුතුය.

**කළමනාකරණයේදී තීරණයක් යනු**

තීරණයක් යනු විකල්ප විසඳුමකි. තීරණ ගැනීම කළමනාකරුවකුගේ ප්‍රධාන කාර්යයකි. එය කලමනාකරණයේ සාරය ලෙස හඳුන්වයි. ආයතනයේ අනාගතය තීරණ ගැනීම මත රැඳේ. තීරණ ගැනීම ක්‍රියාවලියක් ලෙස පෙන්නුම් කළ හැක.

**තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර**
(Decision making process)

ගැටළු ක්‍රමවත්ව අධ්‍යයනය කර ඒ සඳහා විකල්ප විසඳුම් සොයා එම විකල්ප අතුරින් වඩා හොඳ විකල්පය තෝරා ගැනීමේ ක්‍රියාවලිය තීරණ ගැනීමේ ක්‍රියාවලියයි. එය පහත 01 සටහනින් පෙන්නුම් කළ හැක.

**1. ගැටළු හඳුනා ගැනීම**
(Identification of the problem)

අපේක්ෂිත ආකාරයට වඩා වෙනස් ආකාරයකින් කටයුතු සිදුවන විට ගැටළු පැන නගී. ගැටළුවක් ඇති බව දැන ගත් විට කලමනාකරුවන් අනුගමනය කරන ක්‍රියා මාර්ගයන් මේ සඳහා පාදක කර ගත යුතුය. යම් ගැටළුවක් ඇති බව දැනගත් විට කලමනාකරුවන් කළ යුත්තේ එය නිවැරදිව හඳුනා ගැනීමයි. ගැටළුවක් එහි ලක්ෂණ වලින් වෙන් කර නියම ගැටළුව හඳුනා ගත යුතුය. යම් ගැටළුවක් වැරදි ආකාරයට තේරුම් ගත හොත් එය සඳහා දෙන විසඳුම් ද සාර්ථක ඒවා විය නොහැක. ගැටළු විවිධාකාරයෙන් ඉස්මතු විය හැක.

උදා :-


- ❖ සැලසුම් කළ ආකාරයට වඩා සත්‍ය ප්‍රතිඵලය වෙනස් වීම
- ❖ අතීත තත්වයට වඩා වර්තමාන තත්වය වෙනස් වීම
- ❖ තරගකරුවන්ගේ ක්‍රියාකාරීත්වය
- ❖ ගනුදෙනුකරුවන් කලමනාකාරීත්වයට පැමිණිලි ඉදිරිපත් කිරීම



## කළමනාකරණයේ නව ප්‍රවනතා - 2 කොටස

# තීරණ ගැනීම හා ගැටළු විසඳීම පිළිබඳ සංකල්ප

## Concept of decision making and problem solving



(01 සටහන)

**2. විකල්ප විසඳුම් සොයා ගැනීම**
(Developing Alternatives)

කළමනාකරු සිය ගැටළු විසඳා ගැනීමට විකල්ප විසඳුම් ලැයිස්තුවක් ගලපා ගැනීම මින් අදහස් වේ. කළමනාකරුගේ පුරුද්දත්, වෙනත් කළමනාකරුවන් අනුගමනය කරන ක්‍රියාමාර්ගත් මේ සඳහා පාදක කර ගත යුතුය. කළමනාකරුවන් සතු නිර්මාණාත්මක චින්තනය මෙහිදී වැදගත් වනු ඇත.

**3. විකල්ප විසදුම් ඇගයීම**
(Evaluation of Alternatives)

ඉදිරිපත් කළ විකල්ප විසදුම් වෙන් වෙන් වශයෙන් ඇගයීමට භාජනය කිරීම. ඒ ඒ විකල්පයේ ශක්තීන් හා දුර්වලතා අගයමින් සංසන්දනාත්මකව විශ්ලේෂණය කළ යුතුය.

**4. හොදම විකල්ප තේරීම/ විධිමත් තීරණවලට එළඹීම**
(Selecting Best Alternative)

**විකල්ප විසදුම් ඇගයීමෙන් ලබා ගත් විසදුම් මත යෝග්‍ය විකල්පය තෝරා ගැනිම.** මෙහිදී ගැටළුවට විසදුම් ලබාදෙන ආයතනයේ ඉලක්ක හා සම්පත් සමග සැසදෙන ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති හොදම විකල්පය තෝරා ගත යුතුය. හොදම විකල්පයක් තේරීම එතරම් පහසු කාර්යයක් නොවේ. ඊට හේතුව විශිෂ්ඨ විසදුමක් ලැබෙන විකල්පයක් සාමාන්‍යයෙන් නොතිබීමයි. එනම් සෑම විකල්පයකම එයට ආවේණිකවූ දුර්වලතා තිබිය හැක.

**5. තීරණ ක්‍රියාත්මක කිරීම**
(Implementing)


වඩා යෝග්‍ය විකල්පය ක්‍රියාවට නැංවීමයි. එහිදි තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩසටහන් සකස් කිරීම, අවශ්‍ය සම්පත් වෙන්කර දිම. කාර්ය මණ්ඩලයට බලතල හා වගකීම් පැවරීම හා නියෝග දිම සිදු කළයුතුය. එසේම තීරණ ක්‍රියාත්මක විමට අදාල ප්‍රගති වාර්තා ලබා ගැනිමට ද කටයුතු කළ යුතුය.

**6. තීරණ ඇගයිම**
(Evaluation Of Decision)

තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු එය ක්‍රියාත්මක වන ආකාරය නියාමනය කළ යුතුය. තීරණයක් ගත් පමණින් එය නිසි ලෙස ක්‍රියාත්මකවේයැයි උපකල්පනය නොකළ යුතුය. ක්‍රියාත්මක තීරණයේ ප්‍රතිඵල පිලිබද විවිධ පාර්ශ්වයන්ගේ ප්‍රතිචාරමෙන්ම ප්‍රතිපෝෂණය ද ලබා



සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරි,
ප්‍රයිම් ග්‍රාමීන්
මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්.

වැඩිපුර තර්ක ඉදිරිපත් කරන්නේ කිසිවක් කරගැනීමට නොහැකි වූ විටය.

# ප්‍රයිම් ග්‍රාමීන් මඩකලපුව ශාඛාව නව නිවහනකට

ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් ශාඛා ජාලයෙහි 19 වන ශාඛාව වූ ප්‍රයිම් ග්‍රාමීන් මඩකලපුව ශාඛාව පසුගිය මැයි 15 වන දින පෙ: ව: 9.00 ට යෙදුණු සුබ මොහොතින් නව නිවහනකට ගෙවදින ලදි.

මෙතෙක් නො 33, රෝහල පාර , මඩකලපුව යන ලිපිනයෙහි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන ගිය මඩකලපුව ශාඛාව මෙතැන් සිට නො 39/2, සෙන්ට්‍රල් පාර.මඩකලපුව යන ලිපිනයෙහි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබයි. නව නිවහනට ගෙවදීම වෙනුවෙන් පැවැත්වූ උත්සව අවස්ථාවට ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි විය. මෙම අවස්ථාවට, අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි බිමල් සෙනෙවිරත්න සහකාර සාමාන්‍යාධිකාරී කමල් ප්‍රියංග යන මහත්වරුන් ඇතුළු ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්හි නිළධාරීහු, හැටන් නැෂනල් බැංකුවේ මඩකලපුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරතුමන් සහ ගනුදෙනුකාර භවතුන් විශාල පිරිසක් සහභාගී වූහ. එදින එම අවස්ථාවට සමගාමීව ගනුදෙනුකාර භවතුන් විසින් නව යාළු ගිණුම්, ප්‍රයිම් ගිණුම් සහ ස්ථාවර තැන්පතු විශාල ප්‍රමාණයක් ආරම්භ කළ අතර ප්‍රයිම් ග්‍රාමීන් මඩකලපුව ශාඛාවේ විශ්වාසනීය සේවාවට ඔවුනගේ සුබ පැතුම්ද එක් කිරීමට අමතක නොකළහ.



# ප්‍රයිම් ග්‍රාමින් මියුලැසි සත්කාර රන් වාසනා මඩකලපුවට...

"මියුලැසි සත්කාර රන් වාසනා" මඩකලපුව ශාඛාවේ දිනුම් ඇදීම පසුගිය මැයි 15 වෙනිදින පවත්වන ලද්දේ මඩකලපුවේ "සෙල්වා හෝල්" හිදීය ."මියුලැසි සත්කාර කාන්තා ඉතුරුම් ගිණුම් අතරින් කුසපත් ඇදීමෙන් තෝරාගන්නා පළමු ජයග්‍රාහක සාමාජිකාවට වටිනා රන් පෙන්ඩන්ට් එකක්ද, තවත් වාසනාවන්ත ජයග්‍රාහිකාවන් දහහතරදෙනකුට වටිනා සැනසිලි ත්‍යාගයන්ද තිළිණ ලෙසින් ලබාදෙන "මියුලැසි සත්කාර රන් වාසනා" දිනුම් ඇදීම තුළින් මඩකලපුව ශාඛාවේ පහත නම් සඳහන් සාමාජිකාවන් ත්‍යාගලාභී වාසනාවන්ත ජයග්‍රාහිකාවෝ වූහ.

**පළමු ජයග්‍රාහිකාවට හිමි රන් පෙන්ඩනය**

අනයිකඩ්ඩියවේලි මධ්‍යස්ථානයේ කේ.තේවි මහත්මිය විසින් දිනාගන්නා ලදි

**සැනසිලි ත්‍යාග දිනාගත් ජයග්‍රාහිකාවෝ**

**බ්ලෙන්ඩර් දෙක දිනාගන්නා ලද්දේ**

මහිලඩිතීවු මධ්‍යස්ථානයේ වී.ඉදයිරංජනී මහත්මිය<br>
වන්දාරුමූලයි 3 මධ්‍යස්ථානයේ ඒ. පවිත්‍රා මහත්මිය

**උඳුන් දෙකේ ගෑස් කුකර් දෙක දිනාගන්නා ලද්දේ**

මංඡන්තොඩුවායි මධ්‍යස්ථානයේ කේ. ජනූවියා මහත්මිය<br>
ඔරුමුලෙලෙචෝලයි මධ්‍යස්ථානයේ එස්. රාජේස්වරී මහත්මිය

**වටිනා ප්‍රෙෂර් කුකර් දෙකක් දිනූ ජයග්‍රාහිකාවෝ**

තේතාතීවූ මධ්‍යස්ථානයේ ටී.ජෙයරාණී මහත්මිය<br>
කරවෙඩ්ඩි මධ්‍යස්ථානයේ එම්.ප්‍රභා මහත්මිය

**වටිනා රයිස් කුකර් දෙකක් දිනූ ජයග්‍රාහිකාවෝ**

කල්මුණෛ 4 මධ්‍යස්ථානයේ පී.ඊශ්වරීඅම්මා මහත්මිය<br>
තාලන්කුඩා 3 මධ්‍යස්ථානයේ අයි. ජෙකමාලා මහත්මිය

**තනි උදුනේ ගෑස් කුකර් දෙක දිනාගන්නා ලද්දේ**

කුරුමන්වලී මධ්‍යස්ථානයේ එන්.අජිතා මහත්මිය<br>
එරුවිල් මධ්‍යස්ථානයේ ටී.පාක්කියවතී මහත්මිය

**ඉස්ත්‍රික්ක හතර දිනාගන්නා ලද්දේ**

විනායකපුරම් 3 මධ්‍යස්ථානයේ ඊ.ඩී. නීටා මහත්මිය<br>
කල්ලඩිවේලූර් මධ්‍යස්ථානයේ ජේ.විමලාදේවි මහත්මිය<br>
තම්බිලුවිල් 3 මධ්‍යස්ථානයේ එස් කවීතා මහත්මිය<br>
ඕන්තාච්චිමඩම් මධ්‍යස්ථානයේ ආර්. රාජකුමාරී මහත්මිය







මෙම දිනුම් ඇදීමේ අවස්ථාවට ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්හි කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි බිමල් සෙනෙවිරත්න සහකාර සාමාන්‍යාධිකාරී කමල් ප්‍රියංග යන මහත්වරුන් සහ ප්‍රයිම් ග්‍රාමින් සමාගමෙහි නිළධාරීහු සාමාජිකාවන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

## Happy Birthday

මැයි සහ ජූනි මාසයේ උපන්දිනය සමරන ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමඟ පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| නලින් ද සිල්වා මහතා | මැයි 16 | මාතර |
| අමල් ප්‍රගීත් මහතා | මැයි 16 | හම්බන්තොට |
| ජානක සෙනෙවිරත්න මහතා | මැයි 16 | වැලිමඩ |
| යූ.එම්. චමින්ද මහතා | මැයි 16 | වැලිමඩ |
| රුමේෂ් බණ්ඩාර මහතා | මැයි 16 | නාවලපිටිය |
| නුවන් දර්ශන මහතා | මැයි 16 | අම්බලන්ගොඩ |
| චින්තක රාජපක්ෂ මහතා | මැයි 17 | වැලිමඩ |
| යොහාන් ධනංජය මහතා | මැයි 17 | ප්‍රධාන කාර්යාලය |
| කේෂානි කුරුප්පු මෙනෙවිය | මැයි 17 | ප්‍රධාන කාර්යාලය |
| අමිල ප්‍රියන්ත මහතා | මැයි 17 | වැලිමඩ |
| චන්දන ප්‍රසන්න මහතා | මැයි 17 | කඩුවෙල |
| එන්. ශිවරූබන් මහතා | මැයි 17 | මුලතිව් |
| මිතිල සංදීප මහතා | මැයි 17 | මතුගම |
| ඩිෂාන් ඇන්ඩෘ මහතා | මැයි 18 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික වික්‍රමසිංහ මහතා | මැයි 18 | බදුල්ල |
| ප්‍රසාත් නිර්මාල් මහතා | මැයි 18 | මීගමුව |
| තිළිණ ලක්මාල් මහතා | මැයි 19 | වෙන්නප්පුව |
| චතුර ප්‍රියංග මහතා | මැයි 19 | බෙලිඅත්ත |
| ඉන්දික නුවන් කුමාර මහතා | මැයි 21 | ගල්ගමුව |
| තිලාන් කාශ්මීර මහතා | මැයි 21 | නිට්ටඹුව |
| චතුරංග ආරියදාස මහතා | මැයි 21 | රත්නපුර |
| දිනේෂ් තරංග මහතා | මැයි 22 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික සඳරුවන් මහතා | මැයි 22 | පොළොන්නරුව |
| බී කිශාන්ත් මහතා | මැයි 23 | මඩකලපුව |
| සුමුදු සුදර්ශන මහතා | මැයි 23 | ප්‍රධාන කාර්යාලය |
| නිශාන්ත ප්‍රදීප් මහතා | මැයි 23 | මැදවච්චිය |
| ඉරුමි රන්දෙණිය මහත්මිය | මැයි 23 | ප්‍රධාන කාර්යාලය |
| කුමාරසාමි පවිරාජ් මහතා | මැයි 23 | යාපනය |
| චරින්ද විජේසිංහ මහතා | මැයි 23 | හෝමාගම |
| හසාන් අනුරංග මහතා | මැයි 23 | පොළොන්නරුව |
| සුමුදු තුෂාර මහතා | මැයි 24 | මාතර |
| දිනේෂ් රංජන් මහතා | මැයි 24 | ජාඇල |
| අසංක දිසානායක මහතා | මැයි 24 | නුවර එළිය |
| වසන්ත බුද්ධික මහතා | මැයි 24 | කඩුවෙල |
| නුවන් සමීර මහතා | මැයි 24 | කළුතර |
| අනෝමා මල්කාන්ති මහත්මිය | මැයි 24 | ප්‍රධාන කාර්යාලය |
| ගමගේ ඉෂාණී මෙනෙවිය | මැයි 25 | මාතර |
| උදය ප්‍රියන්ත කුමාර මහතා | මැයි 25 | පොතුවිල් |
| ධනංජය සොයිසා මහතා | මැයි 25 | හොරණ |
| කපිල අබේගුණවර්ධන මහතා | මැයි 26 | කෑගල්ල |
| අජිත් ප්‍රේමකීර්ති මහතා | මැයි 26 | බදුල්ල |
| ශ්‍රී කාන්තන් ගීතසරන් මහතා | මැයි 26 | මල්ලාවි |
| කේ. බාලචන්ද්‍රන් මහතා | මැයි 26 | වවුනියා |
| රොහාන් බුද්ධික මහතා | මැයි 26 | ත්‍රිකුණාමලය |
| අසංක ගම්ලත් මහතා | මැයි 27 | කුලියාපිටිය |
| ඒ රෙජිනෝල්ඩ් මහතා | මැයි 28 | මන්නාරම |
| ජනිත් ප්‍රශාන්ත මහතා | මැයි 28 | කඩුවෙල |
| ශාන්ත කුමාර මහතා | මැයි 29 | අම්පාර |
| නුවන් ප්‍රියදර්ශන මහතා | මැයි 29 | මාතර |
| සුජිත් අනුර මහතා | මැයි 29 | ප්‍රධාන කාර්යාලය |
| මහලිංගම් සුමන්රාජ් මහතා | මැයි 30 | වවුනියා |
| අරුණ ප්‍රියශාන්ත මහතා | මැයි 30 | බදුල්ල |
| කපිල තෙන්නකෝන් මහතා | මැයි 30 | හලාවත |
| ඉසුරු මධුරාවල මහතා | මැයි 30 | කඩුවෙල |
| අනිල් සංජීව මහතා | මැයි 31 | මහියංගනය |
| කේ. ලෝගනාදන් මහතා | මැයි 31 | මුලතිව් |
| කපිල ධර්මසේන මහතා | ජූනි 01 | අවිස්සාවේල්ල |
| ශෂිණි තාරිකා මෙනෙවිය | ජූනි 01 | ප්‍රධාන කාර්යාලය |
| චානක ගයාන් සිල්වා මහතා | ජූනි 01 | ගම්පහ |
| සමිත දර්ශන මහතා | ජූනි 01 | කළුතර |
| චමින්ද කුමාර මහතා | ජූනි 02 | හෝමාගම |
| කුෂාන්ත චමින්ද මහතා | ජූනි 02 | වැලිමඩ |
| සනත් ප්‍රියංකර මහතා | ජූනි 02 | අනුරාධපුර |
| මධුශංක වෑකඩපොල මහතා | ජූනි 02 | නුවර |
| ඩිලාන් චම්පික මහතා | ජූනි 02 | හොරණ |
| තිළිණ ප්‍රියංකර මහතා | ජූනි 03 | ඇඹිලිපිටිය |
| අරවින්ද අකලංක මහතා | ජූනි 04 | අම්පාර |
| රුවන් මංජුල මහතා | ජූනි 04 | නොරොච්චෝල |
| එන්. ඥානසුන්දරම් මහතා | ජූනි 04 | මඩකලපුව |
| නිරෝධ අකලංක මහතා | ජූනි 05 | කළුතර |
| සංජීව ප්‍රදීප් මහතා | ජූනි 05 | පදවිය |
| නිරෝෂන් හේරත් මහතා | ජූනි 06 | නගර ශාඛාව |
| නුවන් සංජීව මහතා | ජූනි 07 | මැදවච්චිය |
| චතුරිකා මධුෂානි මෙනෙවිය | ජූනි 07 | ප්‍රධාන කාර්යාලය |
| හර්ෂණ මිලාන් මහතා | ජූනි 07 | කුරුණෑගල |
| ලක්ෂ්මන් චිරාජ් මහතා | ජූනි 08 | ප්‍රධාන කාර්යාලය |
| ඩබ්. ජී. සුරංග මහතා | ජූනි 08 | මීගමුව |
| නුවන් ඉංදික මහතා | ජූනි 08 | හොරණ |
| නුවන් ප්‍රදීප් මහතා | ජූනි 08 | මොරවක |
| එම්. ජෙයදර්ශන් මහතා | ජූනි 09 | ත්‍රිකුණාමලය |
| කෙ. සන්මුගරාජා මහතා | ජූනි 09 | ප්‍රධාන කාර්යාලය |
| කේ ශ්‍රීධරන් මහතා | ජූනි 10 | වවුනියා |
| ඇන්ටන් වෝල්ටා මහතා | ජූනි 10 | නොරොච්චෝලෙ |
| යෝගනාදන් සුදේශන් මහතා | ජූනි 10 | මඩකලපුව |
| සමීර මධුශංක මහතා | ජූනි 10 | ත්‍රිකුණාමලය |
| සුනිල් පෙරේරා මහතා | ජූනි 11 | හොරණ |
| මහේෂ් සජීවන් මහතා | ජූනි 11 | වත්තල |
| මහේෂ් කුමාර මහතා | ජූනි 11 | මාතර |
| සමන් කුමාර මහතා | ජූනි 11 | පදවිය |
| නලින් මධුශාන් මහතා | ජූනි 11 | මොනරාගල |
| එරංද ශ්‍රී ප්‍රියංග මහතා | ජූනි 12 | මාතලේ |
| සංජීව ප්‍රදීප් මහතා | ජූනි 12 | බදුල්ල |
| ශෂිකා ලක්මිණී මෙනෙවිය | ජූනි 12 | නිට්ටඹුව |
| නිරංජන් සෙනරත් මහතා | ජූනි 13 | නුවර |
| චමින්ද ප්‍රියංකර මහතා | ජූනි 14 | මොරටුව |
| දිනේෂ් රුවන් කුමාර මහතා | ජූනි 14 | බෙලිඅත්ත |
| සංජය බණ්ඩාර මහතා | ජූනි 14 | මාතලේ |
| චින්තන සුරේෂ් කුමාර | ජූනි 14 | කුරුණෑගල |
| අජිත් ප්‍රසන්න මහතා | ජූනි 15 | මොනරාගල |
| ටී තවනේශ්වරන් මහතා | ජූනි 15 | අම්පාර |
| ශාලික රජිත් මහතා | ජූනි 15 | අවිස්සාවේල්ල |
| දිශාන් කල්හාර මහතා | ජූනි 15 | බණ්ඩාරගම |

මෙහෙවර
ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ෘ 0112825843
ඊ-මේල් :- manjula.p@primegrameen.lk
වෙබ් :- www.primegrameen.com
අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත් (කළමනාකාර අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිළධාරී)
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කේ.ඩී. චමිල චින්තක (අර්ජුන ග්‍රැෆික්ස් (පුද්) සමාගම)
පරිඝනක අක්ෂර සංයෝජනය :- උදාරී ධර්මවර්ධන / චතුරිකා මධුෂාණි
ඡායාරූප ශිල්පී :- ලක්ෂ්මන් කුමාරතුංග / සුරංග කුරුප්පුආරච්චි